# සාරාගේ හොඳම යාළුවා



ඩබ්.ඒ.රුවින්දි ඔමෙත්මා ද සිල්වා

කෘතියේ නම - සාරාගේ හොඳම යාළුවා

කතෘගේ නම - ඩබ්.ඒ. රුවින්දි ඔමෙත්මා ද සිල්වා

ISBN - 978-624-206-782-7

# පිදුම

මා හැදූ වැඩූ දෙමාපියනි,

ජීවිතය දිනන්නට මඟ කියා දෙන

ගුරු මෑණිවරුනි, ගුරුපියවරුනි,

මාගේ ආදරණීය මහාමායා මාතාවනි,

පිරිනමමි මෙම පොත සෙනෙහසින්.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයේ ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුමකරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැඟී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන්, සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි.

ශෂිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය-මහනුවර.
2023.11.01


සාරාගේ පාසල් නිවාඩුව ආවා. සාරා විනෝද චාරිකා යන්න හරිම ආසයි. ඉතිං සාරා අම්මාටයි, තාත්තාටයි කිව්වා "අපි නිවාඩුවට විනෝද චාරිකාවක් යමුද?" කියලා. අම්මයි, තාත්තයි ඒකට කැමති වුණා.

එයාලා විනෝද චාරිකාව යන්න බඩු ලෑස්ති කළා. නංගි සෙල්ලම් කරන්න ලොකු බෝලයක් ගත්තා. සාරා බෑට් එකක් ගත්තා. අම්මයි, තාත්තයි එයාලගේ ඇඳුම් ලෑස්ති කළා. සාරාත් එයාගේ ඇඳුම් ලෑස්ති කළා. සාරාගේ නංගිත් එයාගේ ඇඳුම් ලෑස්ති කළා.






චාරිකාව යන දවස උදා වුණා. අම්මා උදේම නැගිට්ටා. අම්මා කෑම ගෙනියන්න කෑම හදනවා. සාරාත්, සාරාගේ නංගීත් උදෙන්ම නැගිට්ටා. එයාලා දත කට මැදලා, මුහුණ සෝදලා ලස්සන ගවුම් ඇඳ ගත්තා. එයාලා උදේ කෑම කාලා එයාලාගේ  බඩු ටික අරන් කාරයට නැග්ගා.



එයාලා මුලින්ම යන්න තීරණය කළේ සත්තු වත්තකට.
එයාලා ඒ සත්තු දිහා හරිම ආසාවෙන් බලාගෙන හිටියා.
කොටියෝ,අලියෝ,දිවියෝ වගේ ගොඩාක් සත්තු හිටියා.



නංගී ගොඩාක්ම බලන්න කැමති හාවෝ.

සාරා ගොඩාක්ම බලන්න කැමති මුවෝ.

එතන සමනල උයනකුත් තිබුණා.

තව කුරුලු උයනකුත් තිබුණා.

එයාලා එතනදීම උදේ කෑම අරගෙන තව තැනකට පිටත් වුණා.

එයාලා ඊළඟට යන්න තීරණය කළේ පොඩි කැලයකට. එයාලා  ඒ කැලයට ගියා. එතන හරිම ලස්සනයි. එතන පොඩි පොකුණකුත් තිබුණා. පොකුණේ තාර අම්මයි, තාර තාත්තයි තව තාර පැටවු තුන් දෙනෙකුයි හිටියා.





එතන සමනල්ලු ගොඩාක් හිටියා. "ෂා ලස්සන සමනලයෙක්." සාරා කිව්වා. සාරා ඒ ලස්සන සමනලුන් පිටුපස දුවන්න පටන් ගත්තා. ඒත් සාරා දුවනවා කවුරුත් දැක්කේ නෑ. සාරා තව තවත් සමනල්ලු පස්සේ කැලේ මැදටම ගියා. මේ වෙලාවේ සාරාගේ අම්මයි, තාත්තයි, සාරා ළඟ නැති බව දැන ගත්තා.





නංගි අඬන්න ගත්තා. අම්මයි, තාත්තයි දුවමින් කැලේ හැම තැනම සාරාව හෙව්වා. ඒත් එයාලට සාරාව හම්බ වුණේ නෑ.

සාරා දැන් කැලේ මැදටම ඇවිත්. අම්මයි, තාත්තයි, නංගියි ළඟ නැති බව සාරාට තේරුණා. සාරා  හොඳට ම බය වුණා.

එයාට පාර හොයාගන්න බැරි වුණා. එයා ලොකු ගහක් ළඟ වාඩි වෙලා හොඳටම ඇඬුවා. හවස් වැටීගෙන එනවා. මේ වෙලාවේ චුටි මුව පැටියෙක් සාරා ළඟට ආවා.



සාරාට ගොඩාක් සතුටු හිතුණා. "අනේ යාළුවේ  මං කැලේ අතරමං වෙලා ඉන්නේ" මට අම්මා ළඟට යන්න පාර හොයල දෙන්න." සාරා කිව්වා.

"හොඳයි යාළුවේ මම ඔයාට පාර හොයලා දෙන්නම්" මුවා පිළිතුරු දුන්නා.

සාරා මුවා පිටුපසින්ම ගියා. මුව පැටියා කැලේ පුරා ඇවිද්දා. අවසානයේ මුව පැටියාට හා සාරාට එයාගේ දෙමාපියන් මුණ ගැසුණා.

සාරා මුව පැටියා පිටුපසින් ගිය නිසා අම්මයි, තාත්තයි හම්බ වුණා. සාරාට ගොඩාක් සතුටු හිතුණා. අම්මාටයි, තාත්තාටයි, නංගිටයි ගොඩාක් සතුටුයි. එයාලා මුව පැටියාට ස්තූති කළා.

කරදරයක දී උදවු කරපු මුව පැටියා එදා ඉඳලා සාරාගේ හොඳම යාළුවා වුණා.





## පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතු කොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යාන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වුයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

"දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට,
සෙනෙවිරත්න මහලේකම්
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක
2023.11.01

ISBN 978-624-206-782-7